


**මෙම සමාගමේ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොල රත්මලාන පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## කාර්මික ශිල්පී (පෑස්සුම්) II වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය** : ලබා දෙනු ලබන සැළසුමට අනුව සියළුම පිරි සැකසුම් සහ පෑස්සුම් කටයුතු ඉටු කිරීම හා ගුවන්තොටුපොල තුල සියළු යන්ත්‍ර හෝ පද්ධති ස්ථාපනය කිරීම සහ නවීකරණය කිරීම් වලට අදාළ පෑස්සුම් කටයුතුවලට සම්බන්ධවීම.

**රැකියාවේ වගකීම්** :

(I) Arc Welding, Gas Welding, Spot Welding, Gas Cutting, Grinding, Drilling ආදි සියළුම වැඩ නිසියාකාරව හා කාර්යක්ෂමව ඉටු කල හැකි විය යුතු අතර තමන් නිම කරන පෑස්සුම් හොඳ තත්ත්වයකින් හා මනා නිමාවකින් යුක්ත වීම.

(II) පෑස්සුම්කරුවෙකු නොමැති විට ඔහු විසින් සම්පූර්ණ නොකරන ලද අත්‍යවශ්‍ය රාජකාරී අධීක්ෂණ නිළධාරීන්ගේ උපදෙස් මත ඉටු කිරීම.

(III) වැඩ රාජකාරී කිහිපයක් ඇති අවස්ථාවලදී අධීක්ෂණ නිළධාරියාගේ ලිඛිත හෝ වාචික උපදෙස්වලට අනුව ප්‍රමුඛතාවය මත වැඩ කිරීම.

(IV) හදිසි වැඩ ඇති අවස්ථාවලදී අධීක්ෂණ නිළධාරීන්ගේ උපදෙස් මත අතිකාල සේවයේ රාජකාරී කිරීම.

(V) සේවා කටයුතු අවසන් වීමෙන් පසු අදාළ ස්ථානය පිරිසිදු කර ආරක්ෂාකාරී බව තහවුරු කිරීම.

(VI) සියළුම පෑස්සුම් අවසානයේ පරීක්ෂා කළ යුතු අතර, අනතුරු වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(VII) SI හා මෙට්‍රික් ඒකක වලින් මිනුම් ගැනීම හා වැඩ කිරීම.

(VIII) අධීක්ෂණකවරුන් යටතේ ද්‍රව්‍යයන් හා ව්‍යුහයන් පරීක්ෂා කර ඒවායේ අඩුපාඩු හඳුනා ගැනීම සහ ගුණාත්මක ප්‍රමිතීන් සපුරා ඇති බවට සහතික කිරීම.

(IX) අධීක්ෂණකවරුන් යටතේ ව්‍යාපෘති පිරිවිතයන්ට අනුව ලෝහ සංරචක කැපීම, හැඩගැස්වීම සහ සම්බන්ධ කිරීම.

**සුදුසුකම්** : (අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන් / ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ පැස්සුම් ක්ෂේත්‍රයේ දෑවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලා සහතිකයක් හෝ දෑවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තිය සහතිකයක් පැස්සුම් ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**හෝ**

ජාතික වෘත්තිය සුදුසුකම් 4 වන මට්ටමේ (NVQ Level 4) වෘත්තිය සහතිකයක් පැස්සුම් ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**සහ**

(ආ) ආධුනිකත්ව කාලසීමාවද/ පාඨමාලා කාල සීමාවද/ පුහුණු කාල සීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප** : තෝරාගනු ලබන්නන්හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**බඳවා ගැනීමේ ක්‍රමය** : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම සේවා ස්ථානයක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතක් **"සභාපති, ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල, කටුනායක" යන ලිපිනයට 2025 මාර්තු මස 04 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ වම් කෙළවරේ **කාර්මික ශිල්පී (පැස්සුම්) 11 වන ශ්‍රේණිය** ලෙස සඳහන් කළ යුතුවේ.

**තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

**පාඨමාලා සහතික, සේවා සහතික සහ අදාළ සහතිකවල ඡායා පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

---

**සභාපති**
**ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

**Advertised on 23/02/2025**